# බුද්ධ ධර්මය
## විෂය නිර්දේශය

11වන ශ්‍රේණිය
(වර්ෂ 2008 සිට ක්‍රියාත්මකයි)


ආගම් දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

# විෂය හැඳින්වීම

ශ්‍රී සම්බුද්ධ ධර්මය සෘජුව ම ජීවිතයට ප්‍රායෝගික ව එක් වූ විෂයයකි. ප්‍රායෝගිකත්වයෙන් තොර බුදුදහමක් කිසිසේත් ප්‍රයෝජනයක් නොමැති බව බුදුරදුන් දැඩි ලෙස අවධාරණය කර ඇත. ධර්මය ඇසීම, දැනුම ලබා ගැනීම සඳහා වූ සරලම අවස්ථාව වේ.එතෙකින් නොනැවතී ධර්මය අනුව චින්තනය මෙහෙයවමින් ධර්මය ප්‍රත්‍යක්ෂයක් බවට පත්කර ගැනීම අත්‍යවශ්‍යය.

ආගම් විෂයයනට පාසල් කාල සටහනෙහි වෙන් ව ඇත්තේ සතියකට කාලච්ඡේද දෙකක් පමණි.ඒ කාලය තුළ බුදු දහම දරුවන් තුළ ප්‍රායෝගිකරණය කිරීම භාරදූර කාර්යයක් වී ඇත. බොහෝ පාසල්හි බුද්ධ ධර්ම විෂයය ඉගැන්වීම සඳහා බුද්ධ ධර්මය විෂයය පුහුණු ගුරු භවතුන් නොමැත. ඉතා අපහසුවෙන් වෙනත් විෂය පුහුණු ගුරු භවතෙකුට විටෙක පැවරෙන බුද්ධ ධර්ම විෂයය ඉගැන්වීම පූර්ණ දැනුමක් අත්කර ගැනීමට තරම්වත් සමත් වී නැත.

එබැවින් නව සහස්‍රකයේ විෂයමාලා ප්‍රතිසංස්කරණය, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදයන්හි පර්යේෂණාත්මක වෙනස, ආගම් විෂයය විද්‍යාර්ථීන් තුළට ජීවිත ප්‍රත්‍යක්ෂයක් වීම සඳහා වූ ප්‍රායෝගික ක්‍රියාකාරකමක් බවට පත් කිරීමට ඉඩ ලැබීම වැදගත් පියවරක් ලෙස සඳහන් කරමි. විශාල දැනුම් සම්භාරයක් හිමිකර දිය යුතුය යන ආකල්පයෙන් මෙතෙක් මේ විෂයය දෙස අවධානය යොමු කළ භවතුනට මේ නව ක්‍රම වේදය පිළිබඳ මතුපිට පරීක්ෂාවෙක දී ස්වකීය අදහස සනාථ නොවන බවක් දැක්මෙන් යම් විවාදාත්මක බවක් මතු විය හැකිය. එහෙත් ගුරු පුහුණුව තුළ අදාළ ගුරු භවතුන්ට නොඅඩු විෂය දැනුමක් සහිත ව සිසුන් මෙහෙය විය යුතු ආකාරය පැහැදිලි කෙරේ.

ඒ අනුව බුද්ධ ධර්ම විෂයය ගවේෂණාත්මක ක්‍රියාකාරකමක් ලෙස පන්ති කාමරයට ප්‍රවේශවනු ඇත. සොයා යෑමේ සක්‍රිය ඉගෙනුමක් තුළ පෙරට වඩා ප්‍රත්‍යක්ෂකරණයක පෙරළියක් දරුවන් තුළ ගොඩනැගී දහම අනුව දැහැමි වනු ඇතැයි අපේක්ෂිතය. සිසුන් තුළ සමබර පෞරුෂයක් ඇති කිරීමට බුද්ධ ධර්ම විෂය මෙහෙයවමින් එදිනෙදා ජීවිත අභියෝගවලට සාර්ථකව මුහුණ දිය හැකි සිසු පරපුරක් බිහිකිරීමට ගවේෂණාත්මක ශක්තියක් ලබාදීම නව ක්‍රමවේදයන්හි සමාරම්භක අවස්ථාව වේ. ස්වආධ්‍යාත්මික සංවර්ධන ඇතිකරමින් මෙන් ම සාමූහික ව කටයුතු කිරීමට හුරුකරමින් අධ්‍යාපනයෙහි සියලු අරමුණු සාක්ෂාත් කර ගැනීමට බුද්ධ චරිතය, බුද්ධ ධර්මය, ශාසන ඉතිහාසය ආදී ක්ෂේත්‍ර තුළින් මතුකර ගත් නිපුණතා සංඛ්‍යාත්මක වශයෙන් ප්‍රමාණකර ඒ ඒ ශ්‍රේණීන් වෙත යොමු කර ඇත. සවන ශ්‍රේණියේ සිට එකොළොස්වන ශ්‍රේණිය දක්වා එකම නිපුණතාවක් සාධනය කර ගැනීමට ඒ ඒ ශ්‍රේණිවල දී අදාළ නිපුණතාවයෙහි නිපුණතා මට්ටම් හඳුන්වා දී ඇත. නිපුණතා මට්ටම සාධනය කර ගැනීම සඳහා වූ ක්‍රියාකාරකමක් සාමූහික ව ගවේෂණය කිරීමට යොමුවන ගුරු ශිෂ්‍ය දෙපිරිසම පන්ති කාමරයේ දී සක්‍රිය ව සහභාගිවෙමින් ධර්ම ප්‍රත්‍යක්ෂකරණයෙහි යම් සුභදායක නව ප්‍රවේශයක් ලබා ගනු ඇතැයි බුද්ධ ධර්ම විෂය තුළින් අපේක්ෂා කර සිටී.

# විෂයයේ අරමුණු

බුදු දහමෙහි  මූලික ඉගැන්වීම් අධ්‍යයනය කොට ලෝකය සහ ජීවිතය හඳුනා ගනිමින් අභියෝග ජයග්‍රහණය කිරීමට හැකි දරු පරපුරක් බිහි කර ගැනීම.

බෝසත් චරිතය,බුද්ධ චරිතය සහ ආදර්ශවත් චරිත කථා ඇසුරු කිරීම තුළින් බෞද්ධ පෞරුෂය ගොඩනගා ගැනීමට හුරු කර ගැනීම.

ශාසන ඉතිහාසය සහ ශ්‍රී ලාංකික උරුමය හැඳින එමගින් නූතන වගකීම්  ඉටු කිරීමට හැකි අභිමාන පූර්වක ශ්‍රී ලාංකික බාල පරපුරක් ගොඩනගා ගැනීම.

බෞද්ධ ශිෂ්ටාචාරයෙහි සුවිශේෂී අංග අධ්‍යයනය කරමින් බෞද්ධ අනන්‍යතාව සහ සහජීවනයෙන් ක්‍රියා කිරීමේ අනවරත හුරුවක් චරිතායනය කර ගැනීම.

# විෂය නිර්දේශය 11 ශ්‍රේණිය

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය |
|---|---|---|
| 01.බුදු දහමට අනුව ජීවිතය හා ලෝකය හැඳින ගෙන ක්‍රියා කරයි. | 1.1 කර්මය පුනර්භවයට බලපාන ආකාරය ගවේෂණය කර පාපකර්මයන්ගෙන් වැළකී කුසලකර්මයන්හි යෙදීමට ක්‍රියා කරයි. | කර්මය හා පුනර්භවය |
| | 1.2 සංසාරික දුක ඇතිවන අයුරු පටිච්ච සමුප්පාද ධර්මය ඇසුරෙන් තේරුම් ගනිමින් ගැටලු නිරාකරණයට පටිච්ච සමුප්පාද න්‍යාය ඉවහල් කර ගනියි. | පටිච්ච සමුප්පාද ධර්මය |
| | 1.3 බුදු දහමේ මූලික ඉගැන්වීම් ඇසුරෙන් තම ජීවන දර්ශනය ගොඩනගා ගැනීමට ක්‍රියා කරයි. | බුදු දහමේ මූලික ඉගැන්වීම් තුළින් ගොඩ නැගෙන ජීවන දර්ශනය |
| | 1.4 බුදු දහමේ එන විශ්වය පිළිබඳ ඉගැන්වීම් නවීන විද්‍යාවෙන් සනාථ වන අවස්ථා ගවේෂණය කරයි. | විශ්වය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් |
| 02.තෙරුවන් ගුණ හැඳින චරිතායනය කරයි. | 2.1 බුදුරජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය වටහා ගෙන ශ්‍රද්ධාවෙන් ක්‍රියා කරයි. | බුදුරජාණන් වහන්සේ පිළිබඳව සමකාලීනයන්ගේ හා පසුකාලීනයන්ගේ ඇගයීම් |
| 03. ජීවන රටාව හැඩගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක ශ්‍රාවිකා චරිත උපයෝගී කර ගනියි. | 3.1 භාවනාවේ ප්‍රයෝජන ගවේෂණය කර භාවනාවේ යෙදෙයි. | භාවනාවේ ප්‍රයෝජන |
| | 3.2 ශ්‍රාවක ශ්‍රාවිකා චරිත හදාරා චරිතායනය කරයි. | අනගාරික ධර්මපාලතුමා |
| | 3.3 තම ජීවිතය හැඩගසා ගැනීමට ධම්මපදයේ එන ඉගැන්වීම් භාවිත කරයි. | හයවන ශ්‍රේණියේ සිට දහවන ශ්‍රේණිය තෙක් නිර්දිෂ්ට ගාථා සමෝධානය |
| | 3.4 බුද්ධ කාරක ධර්මය ඇසුරෙන් තම ජීවන රටාව හැඩගසා ගැනීමට ක්‍රියා කරයි. | පාරමිතා |

| | | |
|---|---|---|
| 04. බෞද්ධ සාරධර්ම අගය කරමින් පිළිපදියි. | 4.1 සමාජ සංවර්ධනය ඇතිකර ගැනීමට සිල්වත්වීමෙන් දායක වෙයි. | සීලය හා සමාජ සංවර්ධනය |
| | 4.2 සමාජ ධර්මයක් වශයෙන් යුතුකම් ඉටුකිරීමේ වැදගත්කම තේරුම් ගෙන ක්‍රියාවට නගයි. | සදිසා නමස්කාරය සහ බෞද්ධ සමාජ ධර්ම |
| 05. ජීවී අජීවී පරිසරයට හිතකාමීව හැසිරෙයි. | 5.1 ස්වභාව සෞන්දර්යය ආශ්වාදනය කරමින් පරිසර සංරක්ෂණයට දායක වෙයි. | පරිසර සංරක්ෂණය |
| | 5.2 සෞඛ්‍ය සම්පන්නතාව ඉගෙනුම කෙරෙහි බලපාන අයුරු ගවේෂණය කර ඒ සඳහා බෞද්ධ පිළිවෙත් අනුගමනය කරයි. | කායික හා මානසික සෞඛ්‍ය ඉගෙනුම කෙරෙහි බලපාන අයුරු |
| 06. බෞද්ධ ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික උරුමය හැඳිනගෙන එය රැකගැනීමට ක්‍රියා කරයි. | 6.1 ධර්ම සංගායනා පිළිබඳ අධ්‍යයනය කර ධර්ම සාහිත්‍යය ආරක්ෂාකර ගැනීමට ක්‍රියා කරයි. | සංගායනා මගින් සසුන සුරක්ෂිත වූ අයුරු |
| | 6.2 මහින්දාගමනයෙන් ලද දායාද රක්ෂණය හා පෝෂණය සඳහා හේතුවන ක්‍රියාකාරකම්වල නිරත වෙයි. | මහින්දාගමනයෙන් ලද දායාද රක්ෂණය හා පෝෂණය |
| 07. ශ්‍රී ලාංකික බෞද්ධ අනන්‍යතාවය සුරකිමින් සාමයෙන් හා සහජීවන-යෙන් කටයුතු කරයි | 7.1 මිනිසාගේ ඒකත්වය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් අධ්‍යයනය කර සමානාත්මතා ධර්මයට අනුව ක්‍රියා කරයි. | මනුෂ්‍යාත්වයේ ඒකත්වය |

| | | |
|---|---|---|
| .08. බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය හැඳින ගෙන ඒ අනුව ක්‍රියා කරයි. | 8.1 රාජ්‍ය පාලනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් අගය කරමින් ක්‍රියාවට නැගීමට පෙළඹෙයි. | බෞද්ධ රාජ්‍ය පාලන ඉගැන්වීම් සමාලෝචනය |
| | 8.2 ධනෝපායනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් ක්‍රියාවට නගයි. | ධනෝපායනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් |
| | 8.3 පාලනයේ,ආර්ථිකයේ හා සදාචාරයේ අන්‍යෝන්‍ය සම්බන්ධතාව පිළිගෙන ඒ අනුව ක්‍රියා කරයි. | රාජ්‍ය පාලනය,ආර්ථිකය හා සදාචාරය |
| 09. සුසමාහිත සමබර පෞරුෂයක් ගොඩනගා ගනියි. | 9.1 වැරදි බහුල සමාජයක නිවැරදි ජීවිතයක් ගොඩ නගා ගැනීමට ක්‍රියා කරයි. | පද්මාකාර ජීවිතය |
| 10. නිර්වාණය අරමුණු කොටගෙන ආර්ය මාර්ග යේ ගමන් කරයි. | 10.1 නිර්වාණගාමී ප්‍රතිපදාවෙහි සුවිශේෂත්වය තේරුම් ගෙන එම ප්‍රතිපදාවෙහි නියැලෙයි. | සම්මා දිට්ඨිය නිවන් මගට පූර්වංගමවන බව |

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය

# 11.2.1 හැඳින්වීම

බුදු දහමෙහි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදයත්,ශාස්තෘ වූ බුදුරදුන් ජීවමාන වැඩ සිටියදී ම විවිධාකැරයෙන් භාවිත කොට නිශ්චිත ප්‍රතිඵල විධිමත්ව ලබා ගත් අයුරු පැහැදිලි ව දක්නට ඇත. මෙම පාඨමාලාවට අදාළ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය තීරණය කිරීමේ දී ගවේෂණය පදනම් කර ගෙන සිසු නිපුණතා ගොඩනැගීමට හැකි වන පරිදි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම් සැලසුම් කිරීම කෙරෙහි වැඩි අවධානය යොමු කර ඇත. නිපුණතා පාදක අධ්‍යාපනය සඳහා මෙසේ සූදානම්වීමේ දී ගුරු භූමිකාවේ ද පැහැදිලි වෙනසකින් යුත් කැපවීමක් අපේක්ෂා කෙරේ.ඉගෙනුම්ලාභීන් ද ප්‍රබෝධාත්මකව සක්‍රිය වන අතර අධිකාරී මෙහෙයවීමකින් තොර ව ශිෂ්‍ය කේන්ද්‍රීයත්වයට නිසැකවම පත්වනු ඇත.

ඈත අතීතයේ සිට අපේ පන්ති කාමරවල බහුල ව ක්‍රියාත්මක වූ සාම්ප්‍රදායික සම්ප්‍රේෂණ භූමිකාව හා පසු කාලීනව හඳුන්වා දෙනු ලැබූ ගනුදෙනු භූමිකාව වර්තමාන පන්ති කාමර තුළ තවමත් කැපී පෙනේ. පාසල් හැර යන දරු දැරියන්ගේ චින්තන කුසලතා, පුද්ගල කුසලතා හා සමාජ කුසලතාවල අද දක්නට ලැබෙන පිරිහීම පිළිබඳ සලකා බලන විට ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය සංවර්ධනය විය යුතු බවත් එය සිදුවිය යුතු ආකාරයත් හඳුනා ගැනීම අපහසු නොවේ.

සම්ප්‍රේෂණ ගුරු භූමිකාවේ දී සිසුන් උගත යුතු සියල්ල දන්නා අයෙකු ලෙස ගුරුවරයා පිළිගැනෙන අතර සිසුන් ඒ කිසිවක් නොදන්නා අය ලෙස සලකා ඔවුන් වෙත දැනුම සම්ප්‍රේෂණය කිරීම ගුරු කාර්යය බවට පත් වී තිබේ. ගුරුවරයාගෙන් සිසුනට දැනුම ගලා යාමට පමණක් සීමාවන දේශන මුහුණුවරක් ගන්නා මෙම ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සිසු චින්තනය අවදි කිරීමට හෝ සිසුන්ගේ පෞද්ගලික හා සමාජ කුසලතා සංවර්ධනය කිරීමට හෝ ප්‍රමාණවත් ව දායක නොවේ.

ගුරුවරයා පන්තිය සමග ඇති කර ගන්නා දෙබස ගනුදෙනු භූමිකාවේ ආරම්භක අවස්ථාව වේ. ගුරුවරයාගෙන් පන්තියට හා පන්තියෙන් ගුරුවරයාට ගලා යන අදහස්වලට අමතර ව සිසු - සිසු අන්තර් ක්‍රියා ද පසු ව ඇති වීම නිසා මෙම දෙබස සංවාදයකට පෙරළේ. දන්නා දෙයින් නොදන්නා දෙයට, සරල දෙයින් සංකීර්ණ දෙයට මෙන් ද සංයුක්ත දෙයින් වියුක්ත දෙයට සිසුන් ගෙන යාම සඳහා ගුරුවරයා දිගින් දිගටම ප්‍රශ්නකරණයේ නිරත වේ.

නිපුණතා පාදක අධ්‍යාපනයේ දි ශිෂ්‍ය කාර්යයන් ප්‍රබල ස්ථානයක් ගන්නා අතර පන්තියේ සෑම ළමයෙකු ම ඒ ඒ නිපුණතාව සම්බන්ධ ව අඩු තරමින් ආසන්න ප්‍රවීණතාවට හෝ ගෙන ඒමට මැදිහත්වන සම්පත් දායකයකුගේ තත්වයට ගුරුවරයා පත්වේ.ඉගෙනුමට අවශ්‍ය උපකරණ හා අනෙකුත් පහස්කම් සහිත ඉගෙනුම් පරිසරයක් සැලසුම් කිරීම, සිසුන් ඉගෙන ගන්නා අයුරු සමීප ව නිරීක්ෂණය කිරීම, ශිෂ්‍ය හැකියා හා නොහැකියා හඳුනා ගැනීම, අවශ්‍ය ඉදිරි පෝෂණ හා ප්‍රතිපෝෂණ ලබා දෙමින් සිසුන්ගේ ඉගෙනුම ප්‍රවර්ධනය කිරීම මෙන් ම පන්තිකාමරයෙන් බැහැරට ඉගෙනුම හා ඉගැන්වීම දීර්ඝ කිරීම සඳහා සුදුසු උපකරණ සකස් කිරීම ද මෙහි දී ගුරුවරයාගෙන් ඉටු විය යුතු මූලික කාර්යයන් වේ. යථෝක්ත ගුරු කාර්යභාරය ඇසුරු කොට ගත් ගුරු භූමිකාව පරිණාමන භූමිකාව ලෙස නම් කර තිබේ.

මෙම පාඨ මාර්ගයේ පළමු කොටස මගින් හඳුන්වා දෙනු ලබන විස්තරාත්මක විෂය මාලාව ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගත හැකි ක්‍රියාකාරකම් සන්තතිය එහි දෙවැනි කොටසට ඇතුළත් කර ඇත. මේ සෑම ක්‍රියාකාරකමක් ම අඩු තරමින් පියවර තුනක් ඇතුළත් වන පරිදි සංවර්ධනය කර තිබේ. ක්‍රියාකාරකම්වල පළමු වන පියවර මගින් සිසුන් ඉගෙනුමට සම්බන්ධ කර ගැනීමට අපේක්ෂා කරනු ලැබේ. එබැවින් මෙම පියවර, සම්බන්ධ කර ගැනීමේ පියවර හෙවත් ප්‍රවේශය වශයෙන් හඳුන්වමු. මෙහි ආරම්භයක් ලෙස ගුරුවරයා ගනුදෙනු භූමිකාවේ ලක්ෂණ ප්‍රදර්ශනය කරමින් සිසුන් සමග දෙබසකට මුල පුරයි. පසුව සංවාදයකට පරිවර්තනය විය හැකි මේ දෙබස යටතේ ගවේෂණයේ යෙදීමෙන් සිසුන් සංවර්ධනය කරගත යුතු මූලික නිපුණතා හා සම්බන්ධ පෙර දැනුම සිහිපත් කර ගැනීමටත්, ක්‍රියාකාරකම්වල ඉදිරිය පිළිබඳ ඉඟි ලබා ගැනීමටත් සිසුනට අවස්ථාව සැලසේ. මෙම අදහස් හුවමාරුව සඳහා යොදා ගත හැකි උපක්‍රම රාශියක් ගුරුවරයා සතුව ඇත. ප්‍රශ්න ඉදිරිපත් කිරීම / පින්තූර, පුවත් පත් දැන්වීම් හා සැණ පත් වැනි උත්තේජක යොදා ගැනීම / ගැටලු, ප්‍රහේලිකා හෝ සිද්ධි අධ්‍යයන භාවිතය / දෙබස්, භූමිකා රංගන, කවි, ගීත, ගාථා ආදර්ශන සෘජුව හෝ ශ්‍රව්‍ය පට හෝ දෘශ්‍ය පට ඇසුරෙන් යොදා ගැනීම මෙවන් උපක්‍රම කිහිපයකි. පහත සඳහන් අරමුණු තුන සාක්ෂාත් කර ගැනීමට ප්‍රවේශයක් ලබා ගැනීම සඳහා පළමු පියවර ක්‍රියාත්මක විය යුතුය.

- පන්තියේ අවධානය දිනා ගැනීම
- අවශ්‍ය පෙර දැනුම සිහිපත් කර ගැනීමට සිසුන්ට අවස්ථාව ලබා දීම
- ක්‍රියාකාරකමේ දෙවැනි පියවර යටතේ සිසුන් යොමු කිරීමට අපේක්ෂා කරන ගවේෂණයේ මූලිකාංග සිසුනට හඳුන්වා දීම

ක්‍රියාකාරකමේ දෙවැනි පියවර සැලසුම් කර ඇත්තේ ගවේෂණය සඳහා සසිසුන්ට අවස්ථාව ලබා දිමටය. සිසුන් ගවේෂණයේ යෙදෙන්නේ ඒ සඳහා සුවිශේෂ ව සකස් කරන ලද උපදෙස් පත්‍රිකාවක් පදනම් කර ගෙනය. ගැටලුවට සම්බන්ධ විවිධ පන්ති කණ්ඩායම් වශයෙන් ගවේෂණය කරමින් සහයෝගී ඉගෙනුම් යෙදීමට සිසුනට හැකිවන පරිදි මෙම ගවේෂණය සැලසුම් කිරීමට ගුරුවරයාට සිදු වේ. සපයා ඇති සම්පත් ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගනිමින්, සතිමත් බවෙන් යුතු ව කණ්ඩායම් සාකච්ඡා මෙහෙයවමින් සිසුන් ගවේෂණයේ නිරතවීම මෙම පියවරේ වැදගත් ලක්ෂණ කිහිපයක් වේ. කාලයක් තිස්සේ එබඳු කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත වීම නිසා ස්වයං විනය, අන්‍යයන්ට සවන් දීම, අන්‍යයන් සමග සහයෝගයෙන් වැඩ කිරීම, ඔවුනට උදවු වීම, කාල කළමනාකරණය, ගුණාත්මක බවෙන් ඉහළ නිපැයුම් ලබා ගැනීම, අවංක බව ආදී සාමාන්‍ය ජීවිතයට අවශ්‍ය වැදගත් කුසලතා රැසක් සංවර්ධනය කර ගැනීමට ද සිසුන්ට හැකියාව ලැබේ.

සිසුන් ගවේෂණය සඳහා යොමු කිරීමේ දී කණ්ඩායම් ප්‍රමාණය ගුරුවරයා විසින් තීරණය කළ ද එම ශිෂ්‍ය කණ්ඩායම්වල නායකත්වය පිරිනැමීම පිළිබඳ තීරණ ගැනීමෙන් ගුරුවරයා වැළකී සිටිය යුතු අතර සිසුන් අතරින් නායකයන් මතුවීමට අවශ්‍ය පසුබිම පමණක් මැනවින් සූදානම් කළ යුතුය. සැඟවුණ හැකියා පදනම් කර ගනිමින් අවස්ථාවෝචිත ව නායකත්වය ගැනීමේ වරප්‍රසාදය මේ අනුව සිසුනට හිමි වේ.

ක්‍රියාකාරකමේ තුන්වන පියවරේ දී සෑම කුඩා කණ්ඩායමකට ම තම ගවේෂණ ප්‍රතිඵල අන් අයගේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසේ. මෙහි දී ගුරුවරයා කළ යුත්තේ සමූහ ඉදිරිපත් කිරීම් සඳහා සිසුන් දිරිමත් කිරීමයි. සෑම සාමාජිකයෙකුට ම වගකීම් පැවරෙන පරිදි ඉදිරිපත් කිරීම් සැලසුම් කිරීමට සිසුන් මෙහෙය වීම ද වැඩදායකය. සිසු අනාවරණ පැහැදිලි කිරීම හා සම්බන්ධ මෙම පියවරේ වැදගත් ලක්ෂණයක් වන්නේ අපේ පන්තිකාමර තුළ නිතර ඇසෙන ගුරු කථනය වෙනුවට සිසු හඬ මතු වීමට අවස්ථා සම්පාදනය වී තිබීමය.

ක්‍රියාකාරකම්වල තෙවන පියවරේ දි සොයාගැනීම් වැඩිදියුණු කිරීමට නැතිනම් විස්තාරණයට සෙසු කණ්ඩායම්වල සිසුන් ද යොමු කිරීම අවශ්‍ය වේ. එක් එක් කණ්ඩායම ඔවුන්ගේ ඉදිරිපත් කිරීම් අවසන් කළ පසු ඒ පිළිබඳ සංවර්ධනාත්මක යෝජනා මතු කිරීමට ඉදිරිපත් කළ කණ්ඩායමේ සිසුනට පළමුව ද අනෙක් කණ්ඩායම්වල සිසුනට දෙවනු ව ද අවස්ථාව ලබා දීමෙන් මෙය සිදු කෙරේ. කෙසේ වෙතත් අවසාන සමාලෝචනයෙහි වගකීම ගුරුවරයාටය. සිසුන් නිරත වූ ගවේෂණයට අදාළ වැදගත් කරුණු සියල්ල පැහැදිලි වන සේත් සංකල්ප හා න්‍යායන් පිළිබඳ නිවැරදි අවබෝධය සිසුන් තුළ තහවුරුවන සේත් මෙම සමාලෝචනය සිදු කිරීම ගුරුවරයාගෙන් අපේක්ෂා කෙරේ.

පන්ති කාමර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය අපේක්ෂිත ආකාරයෙන් සාර්ථක ව ඉටු වන්නේ දැයි නිරතුරු ව සොයා බැලීම මෙම ක්‍රම වේදය යටතේ ගුරුවරුන් සතු ප්‍රධාන වගකීමකි. මේ සඳහා තක්සේරුකරණය හා ඇගයීම යොදා ගත යුතු අතර ඒ සඳහා ප්‍රමාණවත් ඉඩකඩ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දී ම ලබා ගැනීමට සැලසුම් ගත ක්‍රියාකාරකම් ගුරුවරයාට අවස්ථාව සලසා දේ. ක්‍රියාකාරකමේ දෙවන පියවර යටතේ සිසුන් ගවේෂණයේ යෙදෙන විට තක්සේරුවටත් ක්‍රියාකිරකමේ තෙවන පියවර යටතේ සිසුන් පැහැදිලි කිරීම් හා විස්තාරණයට යොමු වන විට ඇගයීමටත් ගුරුවරයාට ඉඩ තිබේ.

මේ දක්වා විස්තර කරන ලද ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රම වේදය පරිණාමන භූමිකාව ක්‍රියාත්මක කිරීම සඳහා ගුරුවරයා යොමු කරවයි.මෙහි දී කණ්ඩායම් ගවේෂණයට මුල් තැන ලැබෙන අතර ගනුදෙනුව, සංවාදය හා කෙටි දේශන සඳහා ද ගුරුවරයාට අවකාශ සැලසේ. ප්‍රවේශ පියවරේ දී ගනුදෙනුවට හා සංවාදයට අවස්ථා ඇති අතර අවසාන පියවරේ සමාලෝචනය යටතේ කෙටි දෙසුමකට හා සංකල්ප තහවුරු කිරීමට ගුරුවරයාට ඉඩ ඇත. නව සහස්‍රකයේ පළමු විෂය මාලා ප්‍රතිසංස්කරණය යටතේ ඉදිරිපත් වන මෙම විෂය මාලාව හා සම්බන්ධ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය සංවර්ධනය කිරීමේ දි පරිණාමන ගුරු භූමිකාවට අමතර ව සම්ප්‍රේෂණ හා ගනුදෙනු ගුරු භූමිකාවන්ට අදාළ වැදගත් ලක්ෂණ ගැන ද සැලකිලිමත් වීම මෙම ක්‍රමවේදයේ විශේෂත්වයලෙස සඳහන් කළ හැකි වේ.

බුද්ධ ධර්මය විෂය තුළ දහම ආධ්‍යාත්මීකරණය කොට දැහැමි ක්‍රියාකාරකම් සන්තතියක් සමස්ත ජීවිත උරුමයක් සේ උත්පාදනය කිරීම සඳහා මෙම නිපුණතා පාදක ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය වඩාත් ඉවහල් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. බුදුරදුන් විසින් රාහුල හිමියන්, චුල්ලපන්ථක හිමියන්, කිසාගෝතමියන් වෙත සදහම් ප්‍රත්‍යක්ෂය සඳහා ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් ක්‍රමවේදය මෙයින් වසර දෙදහස් පන්සිය පනහකට පෙර ද භාවිත කර ඇති අතර අරමුණු සාධනය සඳහා දේශන ආදී ක්‍රමවේදයන් ද උචිත අයුරින් යොදා ගෙන ඇති බව ද අමතක කළ නොහැක.මෙම ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය තුළ සියල්ල අන්තර්ගත වි ඇත.

# 2 පාසල් ප්‍රතිපත්ති සහ වැඩ සටහන්

බුද්ධ ධර්මය විෂයය පාසලෙහි ඉගැන්වීමේ දී බුදු දහමේ සමස්ත අර්ථ ක්‍රියාකාරිත්වය අමතක නොකොට ප්‍රමුඛත්වය ලබා දිය යුතුය. පුද්ගල චරිත සංවර්ධනයටත්, සමාජ සුසංයමයත් ගොඩනැගෙන පරමාදර්ශී ඒකකය ලෙස බුද්ධ ධර්ම විෂය භාර ගුරුභවතුන් ක්‍රියා කළ යුතු වන අතර පාසල තුළ දැහැමි බව අගයන නිරන්තර පැවැත්මක් සනාථ විය යුතුය. බෞද්ධ සංකේතයක් ලෙස බුදු මැදුරක් හෝ බුද්ධ ප්‍රතිමාවක් හෝ තිබීම මැනවයි යෝජනා කරන අතරම බුද්ධ ධර්ම විෂයය ඉගැන්වීම සඳහා විෂය පන්ති කාමරයක් වෙන් ව තිබීම ද වඩාත් ඉහළ ආයෝජනයක් කරගත හැක.පන්ති කාමරයෙන් බැහැර ව විෂය සමගාමී වූ බෞද්ධාගමික ක්‍රියාකාරකම් සැබෑ හැඟීමකින් ඉටු කෙරෙන නායකත්ව ආදර්ශයක් පාසල තළ නිර්මාණය විය යුතුය. උදාහරණයක් ලෙස බෞද්ධ ආගමික වතාවත් කරන අවස්ථාවක එම අවස්ථාවේ ප්‍රධානියා ලෙස බෞද්ධ වතාවත් කරන අයෙකු පෙනී සිට නිවැරදි ඉරියව් පවත්වමින් සැමට ආදර්ශයක් සැපයිය යුතුය.

පාසලෙහි දෛනික ආරම්භය, විවේකයෙන් පසු කාලච්ඡේදයේ ආරම්භය සහ දෛනික කටයුතු අවසන් අවස්ථාවන්ට ආගමික ක්‍රියාකාරකම් යොදා ගැනීමක්, මාසික ව, වාර්ෂික ව විශේෂ බෞද්ධ ආගමික ක්‍රියාකාරකම් ළමුන්ට මූලිකත්වය දෙමින් සැලසුම් කිරීමක් අවශ්‍ය ය.

අධ්‍යාපන චාරිකා
පර්යේෂණ ව්‍යාපෘති
දැනුම මිනුම, චිත්‍ර ප්‍රදර්ශන
බිත්ති පුවත්පත්, වාර ප්‍රකාශන
ධර්ම දේශනා. භාවනා වැඩමුළු, පිරිත් පිංකම්, දාන පිරිනැමීම්, ශ්‍රමදාන, අසරණ සරණ සේවා ආදිය උදාහරණ ලෙස දැක්විය හැකිය.

මේ සියලු ක්‍රියාකාරකම් තුළින් මානව වර්ගයා වෙත පමණක් නොව සමස්ත විශ්වය වෙත සිද්ධ කරනු ලබන අර්ථයක්, යහපතක් සහිත ඉගෙනුම්ලාභීන් පිරිසක් බිහි කිරීම ප්‍රතිපත්තිය කොට සැලසුම් සකස් කිරීම විශිෂ්ට ලෙස බුද්ධ ධර්ම විෂය පාසල තුළ ආයෝජනය කිරීමක් වනු ඇත.